පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක: 492

ආයතනයේ නම: පරිසර අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம்: 492

நிறுவனத்தின் பெயர்: சுற்றாடல் அமைச்சு

பாராளுமன்றத்தின் அரசின் கணக்குகள் தொடர்பான தெரிவுக் குழுவினால் சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள் தொடர்பாக, நிலையான கட்டளை இலக்கம் 119(4) இன் கீழ், கௌரவ அமைச்சரின் அவதானிப்புகள் மற்றும் எடுக்கப்படுகின்ற நடவடிக்கைகள் தொடபாக பாராளுமன்றத்துக்கு முன் வைத்தல்

**Parliamentary Publication Series No.: 492**

**Name of Institution: Ministry of Environment**

**Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)**

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : **492**

**ආයතනයේ නම : පරිසර අමාත්‍යාංශය**

**පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක : 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම - 2023 මුදල් වර්ෂය**

| කමිටුව විසින් හඳුනා ගෙන ඇති අඩුපාඩු | අඩුපාඩු නිවැරදි කරගැනීම සඳහා ආයතනය ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය |
|---|---|
| **පළමු කොටස** | |
| 2022.12.13 දිනැති අංක 2022/05 දරණ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 8.1 හා 8.2 ඡේද ප්‍රකාරව සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | වර්තමානයේදී සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ. |
| විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු සැපයීමට හැකි වන සේ කටයුතු කරනු ලැබේ.<br>මේ සම්බන්ධයෙන් අංශ ප්‍රධානීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. |
| අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය. | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු සැපයීමට හැකි වන සේ කටයුතු කරනු ලැබේ.<br>මේ සම්බන්ධයෙන් අංශ ප්‍රධානීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. |
| සියලුම වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත. | අමාත්‍යාංශය සතු වාහන ගණන පනහක් (50) වන අතර එයින් හතළිස් අටක (48) අයිතිය තහවුරු කිරීම සඳහා වන ලියාපදිංචි සහතික අමාත්‍යාංශය සතුව පවතී.<br>ඉතිරි වාහන දෙක එනම්, ආපදා සහන සේවා අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර ඇති අංක KB-7120 දරණ මෝටර් රථය සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර ඇති අංක GW-1326 දරණ ජීප් රථය මෙම අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අදාළ සියලු ලිපි ලේඛන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර මේ වන විට එහි කටයුතු සිදු කරමින් පවතී. |
| සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි. | රාජ්‍ය ලාංඡනය අමාත්‍යාංශයේ වාහනවල ප්‍රදර්ශනය කිරීමට කටයුතු යොදා ඇත. |
| වාහනයක් ගර්හිත වී මාස 08 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි. | 2024.12.18 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2024 අනුව රාජ්‍ය ආයතනවල පවතින විශාල වැය බරක් වන සුබෝපභෝගී වාහන රජයේ ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුව අපහරණය කළ යුතු වාහන තුනක් (03) සහ මෙම අමාත්‍යාංශයට අයත් වාහන අතරින් ප්‍රමුඛතාවයක් සේ සලකා අලුත්වැඩියා කළ යුතු වාහන තෝරා ගැනීමේ කමිටුව විසින් අපහරණය කළ යුතු යයි හඳුනාගත් වාහන තුනක් (03) අපහරණය කිරීමට ප්‍රථම තක්සේරු කිරීම සඳහා කමිටු දෙකක් පත් කර ඇති අතර එම කමිටු දෙක වෙතින් තක්සේරු වටිනාකම ලද වහාම එම වාහන අපහරණය කිරීමට නියමිතය. |

| | |
|---|---|
| පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වර්තමානයේදී කල් ඉකුත් වූ පොදු තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර ඇත. |
| අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවා ගෙන තිබුණි. | එවකට පැවති රජය මඟින් ගත් ප්‍රතිපත්තිමය තීරණයක් යටතේ මෙම අමාත්‍යාංශයට සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කරන ලදි.<br>කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/CM/24/14 හා 2025.01.15 දිනැති ලිපියෙන් සංවර්ධන නිලධාරීන් 568 ක් සඳහා මෙම අමාත්‍යාංශයට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව මේ වන විට අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන නොමැත. |
| **දෙවැනි කොටස** | |
| සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි. | 2023 වර්ෂයට අදාල ව සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී ඇති පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතීමට හේතු වූයේ,<br>i. මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති BD/CBP/01/01/04-2022 හා 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක : 03/2022 මගින් රාජ්‍ය වියදම් පාලනය කිරීමට අදාල ව සිදු කරන ලද සීමා කිරීම් හේතුවෙන් කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීමට හා යම් යම් පුහුණු වැඩසටහන්වල සංශෝධනයන් සිදු කිරීමටද සිදුවීම. (Out Bounding Training / සේවාරම්භක පුහුණු) |
| ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය. | ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ පැවතීමට හේතු වී ඇති,<br>i. සොබාදම් පියස ගොඩනැගිල්ල පිහිටි ඉඩම පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී<br>ii. වත්කම් නීත්‍යානුකූලව පවරාගැනීමට හා පවරාදීමට කටයුතු කරමින් පවතින අතර, පවරාගැනීමෙන් අනතුරුව වත්කම් ගිණුම් ගත කිරීමට හා පවරාදීමෙන් අනතුරුව එම වත්කම් ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.<br>**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**<br>**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**<br>**(අ)** (i) පරිසර අමාත්‍යාංශය පවත්වා ගෙන යනු ලබන සොබාදම් පියස ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ තක්සේරු වටිනාකම වූ රු. 261,000,000 ක් මූල්‍ය නොවන වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කිරීමට හා ඉඩම නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සමඟ ඉඩම පවරාදීම ප්‍රමාදවීම පිළිබඳව සාකච්ඡාවක් ඉල්ලූ නමුත් ලබා නොදීම මත මෙම අමාත්‍යාංශය විසින් ප්‍රවාහන, මහාමාර්ග සහ නිවාස සංවර්ධන අමාත්‍යාංශය (නාගරික සංවර්ධන අමාත්‍යාංශය අයත්) එක්ව අමාත්‍ය මණ්ඩලය වෙත ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට යෝජනා කර ඒ සඳහා කෙටුම්පත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය 2026.03.27 දින ප්‍රවාහන, මහාමාර්ග සහ නිවාස සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ එකඟතාවය ලබා ගැනීම සඳහා යොමු කර ඇත. |

| | |
|---|---|
| | මේ අනුව සොබාදම් පියස ගොඩනැගිල්ල පිහිටි ඉඩම පවරාගැනීමට අදාළ කටයුතු ප්‍රමාද වන්නේ මෙම අමාත්‍යාංශයේ ප්‍රමාදයක් හේතුවෙන් නොවන බව සඳහන් කරමි. |
| (ii). අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් අගය තුළ 2023 නොවැම්බර් 09 දින අපහරණය කර තිබූ වාහනයකට සහ 2023 දෙසැම්බර් 31 දින වන විට වෙනත් ආයතන වෙත පවරා දී තිබුණු වාහන 10 කට අදාල රු.27,790,000 ක වටිනාකම ද ඇතුළත්ව තිබුණි. | අපහරණය කරන ලද අංක KA-3327 දරණ ජීප් රථයේ වටිනාකම 2025 නොවැම්බර් මාසයේ සිගාස් පද්ධතියේ මූල්‍ය නොවන වත්කම් වලින් ඉවත් කර ඇත.<br>උමා ඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතියට තාවකාලිකව අනුයුක්ත කර තිබූ වාහන 10 වාරිමාර්ග අමාත්‍යාංශයට නීත්‍යානුකූලව පවරාදීමට සම්පූර්ණ කරන ලද MTA6/8 ආකෘතිපත්‍ර සහ අදාළ ලිපි ලේඛන 2022.04.26 දිනැතිව වාරිමාර්ග අමාත්‍යාංශය වෙත යොමු කර තිබුණද ඒවා පවරාගැනීමට කටයුතු කර නොතිබූ බැවින්, නැවත සම්පූර්ණ කරන ලද MTA6/8 ආකෘතිපත්‍ර 2025.11.12 දිනැතිව ද ලබාදී ඇති අතර මේ වන තෙක් එම වාහන පවරාගැනීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව කටයුතු කර නොමැ.ත |
| iii.) වර්තමානයේදී පරිසර අමාත්‍යාංශය විසින් භාවිතා කරනු ලබන රු.12,400,000 ක් වටිනා වාහන 03 ක් පරිසර අමාත්‍යාංශය නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එම අගයන් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් අගය තුළද ඇතුළත් කර නොතිබුණි. | වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයට අයත් KO-8812 දරණ මෝටර් රථය මෙම අමාත්‍යාංශය වෙත පවරාගෙන ඇත.<br>ආපදා සහන සේවා අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර ඇති අංක KB-7120 දරණ මෝටර් රථය සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර ඇති අංක GW-1326 දරණ ජීප් රථය මෙම අමාත්‍යාංශය වෙත පවරාගැනීමට අදාළ සියලු ලිපි ලේඛන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර මේ වන විට එහි කටයුතු සිදු කරමින් පවතී. |
| **2. මූල්‍ය සමාලෝචනය**<br><br>**2.1 වියදම් කළමනාකරණය** | |
| (අ). 2023 වර්ෂය සඳහා ව්‍යාපෘති 02 ක් වෙනුවෙන් ප්‍රතිපාදනය කරන ලද මුදල වූ රු.122,070,000 න් සියයට හැටකට වැඩි මුදල් ප්‍රමාණයක් වියදම් නොකර ඉතිරි වී ඇති අවස්ථා නිරීක්ෂණය විය. | i. මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති BD/CBP/01/01/04-2022 හා 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක: 03/2022 මගින් රාජ්‍ය වියදම් පාලනය කිරීමට අදාලව සිදු කරන ලද සීමා කිරීම්වලට අනුගතවීමට සිදුවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත.<br><br>ii. ව්‍යාපෘති කාර්යයන් සැලසුම්ගතව සිදුකිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |
| (ආ). මුදල් රෙගුලාසි 66 යටතේ වැය විෂයන් 06 ක් සඳහා ප්‍රතිපාදන වශයෙන් ලබා ගත් එකතුව රු.17,400,000 න් රු.2,414,013 ක ප්‍රමාණයක් වියදම් නොකොට ඉතිරි වී ඇති බව නිරීක්ෂණය විය. | අවශ්‍යතාවය මත පමණක් මු.රෙ.66 ප්‍රකාරව වැය විෂය මාරු කර ප්‍රතිපාදන වෙන් කර ගන්නා ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත. |

| | |
|---|---|
| (ඇ). පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී වාර්ෂික අයවැය ගත ප්‍රතිපාදන ලෙස රු.මිලියන 150 ක් වෙන් කර තිබුණු අතර එම ප්‍රතිපාදනයෙන් රු.මිලියන 45 ක් මුදල් රෙගුලාසි 66 යටතේ අමාත්‍යාංශයේ වාර්ෂික වැඩසටහන් සඳහා වූ ප්‍රතිපාදන යටතට මාරු කර එම මුදල 2023 වර්ෂයේ පැවති ආසියා ශාන්තිකරයේ අමාත්‍යවරුන්ගේ හා පරිසර බලධාරීන්ගේ සංසදයේ 5 වැනි සැසිය සඳහා භාවිතා කර තිබුණි. පරිසර සංරක්ෂණ කටයුතු සඳහා ඍජුව බලනොපාන කටයුත්තක් වූ උක්ත සැසිය සඳහා පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහනට වෙන්කරන ලද අයවැය ප්‍රතිපාදන වලින් සියයට 30 ක් පමණ වැයකර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | ආසියා ශාන්තිකරයේ අමාත්‍යවරුන්ගේ හා පරිසර බලධාරීන්ගේ සංසදයේ 5 වැනි සැසිය ශ්‍රී ලංකාව තුළ පැවැත්වීම සම්බන්ධයෙන් ලබාදුන් අමාත්‍ය මණ්ඩල තීරණය හා මුදල් ආර්ථික ස්ථායීකරණය සහ ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ නිරීක්ෂණය අනුව පරිසර අමාත්‍යාංශය වෙත 2023 වාර්ෂික අයවැය යටතේ වෙන්කර ඇති ප්‍රතිපාදන මගින් කළමනාකරණය කර ගැනීම සුදුසු බව දන්වා ඇති අතර 2023.01.27 දින නිකුත් කරන ලද වියදම් පාලන අයවැය චක්‍රලේඛ අංක 01/2023 අනුව 2023 වර්ෂයේ ක්‍රියාත්මක නොවූ වැඩසටහන් වල ප්‍රතිපාදන මේ සඳහා ලබා ගනු ලැබීය.<br><br>මානව වර්ගයා අද දින දේශගුණික විපර්යාස, ජෛව විවිධත්ව හායනය හා පරිසර දූෂණය යන ගෝලීය ත්‍රිත්ව අර්බුදයන් හට මුහුණදෙමින් සිටී. මෙම අර්බුදයන් අසමානතාවයන් උග්‍ර කරන අතර මානව වර්ගයා අතර සමානුපාතික නොවන අයුරින් බලපෑම් ඇති කරයි. එබැවින් පරිසරය ආරක්ෂා කිරීම සඳහා ජාතීන් වශයෙන් සියළු දෙනා එක්ව සහයෝගීත්වයෙන් කටයුතු සිදු කළ යුතුව ඇත. ගෝලීය පාරිසරික ඉලක්ක වෙත ලගා වීමට ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතුය. එම ජාත්‍යන්තර සංවිධාන සමඟ එක්ව එම පරමාර්ථ ඉටු කර ගැනීමේදී පරිසර සංරක්ෂණ ව්‍යාපෘති සඳහා ප්‍රදාන ලබා ගැනීම පරිසර සංරක්ෂණය පිළිබඳ පුහුණුව සඳහා ශිෂ්‍යත්ව ලබා ගැනීම විද්‍යාත්මක දැනුම වෙනත් රටවල් සමඟ බෙදා ගැනීම විදේශ අනුග්‍රහය රටට ලැබෙන ප්‍රතිලාභ වේ.<br><br>උක්ත සැසිය 2024 වර්ෂය තුළ නයිරෝබි නුවර පැවැත්වීමට නියමිත එක්සත් ජාතීන්ගේ පරිසර සමුළුවේ 06 වැනි සැසිය වෙත කලාපීය අදහස් ලබා දීමේ අරමුණ ඇතිව කලාපීය පාරිසරික න්‍යාය පත්‍රය සාකච්ඡා කිරීම සඳහා පැවැත්වුන සැසියකි. |
| **2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම** | |
| (අ). අමාත්‍යාංශය විසින් 2023 වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ මුළු එකතුව රු.19,511,266 ක් වුවද භාණ්ඩාගාර මුද්‍රිත (CIGAS) මඟින් ලබාගත් බැඳීම් හා බැරකම් වාර්තාව (SA-92) අනුව ශේෂය 11,485,100 ක් වූ අතර, ඒ අනුව අමාත්‍යාංශය විසින් 2023 දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් අගයන් නිවැරදිව හඳුනාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | වර්තමානයේදී බැරකම් නිසි පරිදි හඳුනාගෙන ගිණුම් තැබීමට කටයුතු කරනු ලැබේ. |

| | |
|---|---|
| **2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම** | |
| (i). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br><br>මුදල් රෙගුලාසි 104 (1) (4) | අංක CAC-0172 දරණ ජීප් රථය අනතුරට පත්වීම පිළිබඳව මු.රෙ.104(4) යටතේ කරන ලද පරීක්ෂණයේ අවසන් වාර්තාව 2024.07.15 දින ලබාදී ඇති අතර එම වාර්තාව 2024.07.22 දිනැතිව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.<br><br>අංක KX-7665 දරණ මෝටර් රථයේ සිදුවූ අනතුර සම්බන්ධයෙන් පත් කරන ලද මු.රෙ.104 (04) කමිටුවේ නිර්දේශ 2022.05.17 දිනැතිව ලබාදී ඇත. |
| (ii). භාණ්ඩාගාර චක්‍රලේඛ<br>2017 දෙසැම්බර් 31 දිනැති අංක 02/2017 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයට අයත් KO-8812 දරණ මෝටර් රථය මෙම අමාත්‍යාංශය වෙත පවරාගෙන ඇත.<br><br>ආපදා සහන සේවා අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර ඇති අංක KB-7120 දරණ මෝටර් රථය සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර ඇති අංක GW-1326 දරණ ජීප් රථය මෙම අමාත්‍යාංශය වෙත පවරාගැනීමට අදාළ සියලු ලිපි ලේඛන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර මේ වන විට එහි කටයුතු සිදු කරමින් පවතී. |
| **3. මෙහෙයුම් සමාලෝචනය**<br>**3.1 විදේශ ආධාර ව්‍යාපෘති**<br>**3.1 (අ) දේශගුණ විපර්යාස අවම කිරීමේ ක්‍රියාකාරී සහයෝගීතා ව්‍යාපෘතිය** | |
| (i). දේශගුණ විපර්යාස අවම කිරීමේ ක්‍රියාකාරී සහයෝගීතා ව්‍යාපෘතිය යටතේ ජාතික දේශගුණ විපර්යාස සඳහා වූ දත්ත හුවමාරු ජාලකරණ පද්ධතිය ස්ථාපිත කිරීමට අදාලව රු.31,000,000 ක මුළු පිරිවැයක් දරා තිබුණු අතර අදාල උපදේශන සමාගමින් ලබා ගත් රු.3,100,000 වටිනා කාර්යසාධන බැඳුම්කරය 2024 අප්‍රේල් 12 දින කල් ඉකුත්වීමට නියමිතව පැවතියද අපේක්ෂිත අරමුණ ඉටුකර ගත හැකි වන පරිදි එම දත්ත හුවමාරු ජාලකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කාර්යසාධන මට්ටමක් ළඟා කර ගත හැකි ආකාරයට කටයුතු සිදුකර නොමැති බව නිරීක්ෂණය විය. | මෙම ජාතික දේශගුණ විපර්යාස සඳහා වූ දත්ත හුවමාරු ජාලකරණ පද්ධතියේ කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් පරිදි Deliverable 4, 5, 6 හි කාර්යයන් සතුටුදායක ලෙස සම්පූර්ණ කර ඇති බව 2021.04.09 දින රැස්වූ අමාත්‍යාංශ උපදේශන ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර ඇත. එමෙන්ම Deliverable 7 හි සඳහන් පරිදි පළමු වසර, දෙවන වසර හා තුන්වන වසර නඩත්තු කටයුතු නිසි පරිදි අවසාන කර ඇති බව අදාල නිලධාරීන් තහවුරු කර ඇත.<br><br>එමෙන්ම ජාතික දේශගුණ විපර්යාස සඳහා වූ දත්ත හුවමාරු ජාලකරණ පද්ධතිය ස්ථාපිත කිරීමට අදාළව උපදේශන සමාගමෙන් ලබා ගත් රු.3,100,000.00 වටිනා කාර්යසාධන බැඳුම්කරය, පරිසර අමාත්‍යාංශයේ ගිණුමට තැන්පත් කිරීමට කටයුතු සිදු කරනු ලැබුණි. නැවත මෙම පද්ධතිය ක්‍රියාකාරී තත්ත්වයට පත්වූ විට එම මුදල නිදහස් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට නියමිත විය. ඒ අනුව මෙම පද්ධතියේ ක්‍රියාකාරීත්වය ඇති කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ජාතික බලයලත් අධිකාරියේ දෙවන සූදානම්වීමේ ව්‍යාපෘතිය (2nd NDA Readiness Project) මඟින් ලබා ගෙන, මෙම පද්ධතිය පිළිබඳ විශ්ලේෂණයක් ලබාගැනීම ද, ඵලදායී භාවිතය සඳහා පරිශීලක ධාරිතාව ගොඩනැගීම සඳහා වැඩමුළු |

| | |
|---|---|
| | මාලාවක් ද පැවැත්වීම මගින් පද්ධතිය යළි ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම ද සිදු කරන ලදී. ඉන්පසුව, එම මුදල එම ආයතනය වෙත ගෙවා ඇත. |
| (ii). ජාතික දේශගුණ විපර්යාස සඳහා වූ දත්ත හුවමාරු ජාලකරණ පද්ධතිය නඩත්තු කිරීම සඳහා පළමු වර්ෂය (2022) හා දෙවන වර්ෂය (2023) ට අදාලව රු.1,860,000 ක නඩත්තු පිරිවැයක් දරා තිබුණද විගණිත දිනය වන 2023 නොවැම්බර් 09 දින වන විටත් දත්ත හුවමාරු ජාලකරණ පද්ධතිය අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණු බව නිරීක්ෂණය විය. | Climate Smart Initiative පුද්ගලික සමාගම විසින් වසර තුනක් සඳහා මෙම පද්ධතියේ නඩත්තු කටයුතු උදෙසා ගිවිසුමක් අත්සන් කර ඇත. ඒ අනුව එම ගිවිසුමේ වලංගු කාලය 2024.02.11 දින වන විට අවසන් විය. ඉන්පසුව මෙම පද්ධතියේ නඩත්තු කටයුතු වලින් එම ආයතනය බැහැර විය. නමුත් ඔවුන්ගේ සේවා කාලය අතරතුර පැන නැගුණු තාක්ෂණික දෝෂ නිරාකරණය කිරීම සහ පද්ධතියේ නඩත්තු කටයුතු නිසි ලෙස මෙම ආයතනය විසින් සිදු කරන ලදී. එබැවින් නඩත්තු සේවා කාලය අවසන් වූ පසු ඇති වූ තාක්ෂණික දෝෂ නිරාකරණය කර එම මුදල එම ආයතනය වෙත ගෙවා ඇත. |
| (iii). දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය විසින් ජාතික දේශගුණ විපර්යාස සඳහා වන දත්ත හුවමාරු ජාලය ස්ථාපිත කිරීමට අදාලව දත්ත ලබා දෙන පාර්ශවකාර ආයතන සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළඹ තිබූ අතර දත්ත සැපයුම්කාර ආයතන 55 ක් හඳුනාගෙන තිබුණද ආයතන 08 ක් සමඟ පමණක් අවබෝධතා ගිවිසුම් අත්සන් කර තිබුණි. | පළමුව එම අවබෝධතා ගිවිසුම් වසර දෙකක් සඳහා පමණක් බලපැවැත්වෙන ලෙස සකසා තිබුණි. නමුත් එම වසර දෙක අවසානයේ, එම ආයතන විසින් නැවත අවබෝධතා ගිවිසුම්වලට එළඹීමට ප්‍රථමව, ආයතන විසින් වෙනස් වූ කේන්ද්‍රීය ස්ථානයන්ට පුහුණු සැසි පැවැත්වීමට සිදුකළ ඉල්ලීම් අනුව 2024 දෙසැම්බර් මාසයේ එම නැවත පත්කරන ලද නිලධාරීන් උදෙසා පුහුණු සැසි පැවැත්වීම ද, එම නිලධාරීන්ගේ ගැටළු හා යෝජනා පිළිබඳව ද සාකච්ඡා කරන ලදී. එහිදී මෙම පද්ධතිය සංවර්ධන අවස්ථාවේදී එක් එක් ආයතන විසින් ලබා දියයුතු පරාමිතීන් නැවතත් වලංගුකරණය කරන ලෙස සාකච්ඡා විය. ඒ අනුව මෙම පරාමිතීන් නැවත වලංගුකරණය සිදු කොට, අවබෝධතා ගිවිසුම් කාලය දීර්ඝ කොට ආයතන සමඟ ගිවිසුම් ගත වීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| (iv). දත්ත හුවමාරු ජාලකරණ පද්ධතිය සඳහා දත්ත සපයන ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් ඇති කර ගැනීමට පෙර අදාල ආයතන වෙත පරිගණක යන්ත්‍ර ලබා දී තිබුණි. | මෙම ව්‍යාපෘතිය 2021 වසර වන විට අවසන් විය. එසේම එම පරිගණක මෙම දත්ත එකතු කිරීම සඳහා පමණක් භාවිතා කරන ලෙසත්, නිසි පරිදි දත්ත, පද්ධතිය වෙත ඇතුළත් කරන ලෙසත් අදාළ ආයතන දැනුවත් කරන ලදී. |
| (v). 2021 වර්ෂයේදී අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම් 04 ක් විගණිත දින වන විට කල් ඉකුත් වී තිබුණි. | වසර දෙකක් සඳහා පමණක් බලපැවැත්වෙන ලෙස සකසා තිබූ අවබෝධතා ගිවිසුම්වල කාල සීමාව අවසානයේ නැවත ගිවිසුම්වලට එළඹීමට ප්‍රථමව, ආයතන විසින් වෙනස් වූ කේන්ද්‍රීය ලක්ෂයන්ට පුහුණු සැසි පැවැත්වීමට සිදු කළ ඉල්ලීම් අනුව, 2024 දෙසැම්බර් මාසයේ එම නැවත පත්කරන ලද නිලධාරීන් උදෙසා පුහුණු සැසි පැවැත්වීම ද, එම නිලධාරීන්ගේ ගැටළු හා යෝජනා පිළිබඳව ද සාකච්ඡා කරන ලදී. එහිදී පරාමිතීන් නැවතත් වලංගුකරණය සිදුකොට, අවබෝධතා ගිවිසුම් කාලය දීර්ඝ කොට ආයතන සමඟ ගිවිසුම් ගත වීමට සාකච්ඡා විය. ඒ අනුව අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |

| | |
|---|---|
| (vi). අවබෝධතා ගිවිසුමේ 2 වන වගන්තිය යටතේ “d” යන කරුණෙන් පරිසර අමාත්‍යාංශය විසින් දත්ත සපයනු ලබන ආයතන වෙත දත්ත ජාලය සඳහා ප්‍රවේශය ලබා දිය යුතු බවට දක්වා තිබුණද අදාල පාර්ශවකාර ආයතන වෙත අවසර ප්‍රවේශය (Authorization Access) ලබා දී නොතිබුණි. | මේ වන විට නැවත පත්කරන ලද සියලුම කේන්ද්‍රීය ලක්ෂයන් සඳහා අවසර ප්‍රවේශය සකසා දී ඇත. |
| (vii). අවබෝධතා ගිවිසුමේ 2 වන වගන්තියේ “e” කරුණ අනුව දත්ත සපයන ආයතනය විසින් නිවැරදි, විශ්වසනීය හා පිළිගත හැකි දත්ත ජාතික දේශගුණ විපර්යාස සඳහා වූ දත්ත හුවමාරු ජාලය සඳහා යොමු කරන බවට තහවුරු කළයුතු බව දක්වා තිබුණද අදාල ආයතන විසින් විගණිත දින දක්වාම දත්ත හුවමාරු ජාලය වෙත දත්ත යොමු කර නොතිබුණි. | දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලයේ මෙම පද්ධතිය පිළිබඳ පුහුණුව හා නිපුණතාවය ලබා ඇති නිලධාරිණිය ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ස්ථාන මාරුවක් ලබා ගෙන ඇති හෙයින්, එම නිලධාරිණිය නිදහස් කිරීමට පෙර, මෙම අංශයේ වෙනත් නිලධාරිණියන් තිදෙනෙකු ඒ සඳහා පුහුණුව හා නිපුණතාවය ලබා දී මෙම දත්ත පද්ධතිය යාවත්කාලීන කර පවත්වාගෙන යාම ආරම්භ කර ඇත. |
| (viii). අවබෝධතා ගිවිසුමේ 6 වන වගන්තිය අනුව දත්ත සපයන ආයතන සමඟ අත්සන් කරන ලද ගිවිසුම කාලානුරූපව සමාලෝචනය කර අවශ්‍ය වෙනස්කම් සිදුකර ගත යුතු වුවද විගණිත දිනය වන විටත් පාර්ශවකාර ආයතන සම්බන්ධීකරණය කර ගනිමින් අවශ්‍යතා සමාලෝචනය කර නිසි පරිදි ගිවිසුම යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | 2024 දෙසැම්බර් මස සියලුම කේන්ද්‍රීය ලක්ෂයන් වෙත පුහුණු සැසි පවත්වන ලදී. එසේම ඔවුන් සමඟ සාකච්ඡා කොට, එක් එක් ආයතනයන් විසින් ලබා දියයුතු දත්ත වලංගුකරණයක් සිදු කොට, නැවත අලුතින් ගිවිසුම් ගත කාලය දීර්ඝ කොට අවබෝධතා ගිවිසුම් වලට එළඹීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| (ix). 2021 නොවැම්බර් 19 දින පැවැති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය සතුටුදායක මට්ටමක නොපවතින බව කාරක සභාව සඳහන් කර තිබුණු අතර අදාල අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් ඇතිකර ගනිමින් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදයක් පැවතිය යුතු බව හා මෙම පද්ධතිය දිගින් දිගටම පසු විපරම් කිරීමේ අවශ්‍යතාවයද අවධාරණය කර තිබුණද අමාත්‍යාංශය විසින් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැති බව නිරීක්ෂණය විය. | මෙම පද්ධතිය ක්‍රියාකාරී පද්ධතියක් ලෙස පවත්වා ගැනීමට පාර්ශවකාර ආයතනයන් විසින් එම අදාළ දත්තයන් පද්ධතිය වෙත ඇතුළත් කළ යුතුය. නමුත් සීමිත සේවක සංඛ්‍යාව යටතේ අදාළ කාර්යයන් සිදු කළ යුතු බැවින් හා එම නිලධාරින් ස්ථාන මාරුවීම් ලබා යාමත්, පත්වන නව නිලධාරින් හට පද්ධතිය පිළිබඳව දැනුම ලබාදීමට නැවත නැවතත් පුහුණු සැසි පැවැත්වීමට සිදුවීමත්, සමහර දත්තයන් විශ්ලේෂණය කොට ද්විතීක දත්තයන් ලෙස පද්ධතියට ඇතුළත් කිරීමට සිදුවීමත් නිසා, දත්ත පද්ධතිය වෙත ඇතුළත් කිරීමට යම් ප්‍රමාදයක් පැවතියද, මෙම පද්ධතිය ක්‍රියාකාරී පද්ධතියක් ලෙස පවත්වා ගැනීමට අවශ්‍ය කටයුතු ප්‍රමුඛතාවයකින් යුතුව සිදු කරමින් පවතී. |
| (x). උක්ත රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී ජාතික දේශගුණ විපර්යාස දත්ත හුවමාරු ජාල පද්ධතිය යාවත්කාලීන කර රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව දැනුවත් කරන ලෙසට අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට නිර්දේශ කර තිබුණද විගණිත දිනය වන විටත් දත්ත පද්ධතිය යාවත්කාලීන කර රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව දැනුවත් කිරීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | පවතින සීමිත සේවක සංඛ්‍යාවක් යටතේ අදාළ සියලු කාර්යයන් සිදු කල යුතු බැවින්, එහි යම් ප්‍රමාදයක් පැවතියද, මෙම වසර තුළ මෙම පද්ධතිය ක්‍රියාකාරී පද්ධතියක් බවට පත් කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දී කටයුතු සිදුකරමින් පවතී. |

| | |
|---|---|
| **3.1 (ආ) සුවදායී භූමි දර්ශ ව්‍යාපෘතිය** | |
| (i). සුවදායී භූමි දර්ශ ව්‍යාපෘතිය යටතේ තුම්බිකුලම වැව ප්‍රතිසංස්කරණය කිරීමට අදාලව 2022 ජනවාරි 26 දින පළුගස්වැව ප්‍රාදේශීය සම්බන්ධිකරණ රැස්වීමේදී සාකච්ඡා කර ඇති අතර, වන සංරක්ෂණ හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිල්ධාරීන් විසින් වනජීවීන්ගේ ප්‍රයෝජනය සඳහා මෙම වැව සොරොව්වක් රහිතව ප්‍රතිසංස්කරණයට වාචිකව එකඟතාවය ලබාදී තිබුණි. ඒ අනුව මෙම වැව සොරොව්වක් රහිතව ඉදිකිරීමට එකඟතාවය ලැබී තිබුණ ද සුවදායී භූමි **දර්ශ** ව්‍යාපෘතිය යටතේ තුම්බිකුල්ම වැවෙහි රු.1,541,477ක් වැයකර සොරොව්වක් ඉදිකර ඇති බව 2023 අගෝස්තු 14 දින සිදුකරන ලද භෞතික විගණන පරීක්ෂාව අනුව නිරීක්ෂණය විය. | මේ වන විට අනුමැතිය ලබා ගතයුතු සියලු ආයතන වෙතින් ලිඛිතව අනුමැතිය ලබාගෙන ව්‍යාපෘති කටයුතු ආරම්භ කරන ලෙස උපදෙස් ලබා දී ඇත. |
| (ii). රුපියල් මිලියන 51.56 ක පමණ පිරිවැයක් දරා වගා කටයුතු සඳහා ජලය ලබා ගැනීමේ අරමුණින් තුම්බිකුලම වැව ප්‍රතිසංස්කරණය කර තිබුණද එම වැව මඟින් වගා කටයුතු සඳහා ජලය මුදා හැරීමේ හැකියාවක් නොමැති බව නිරීක්ෂණය වූ අතර වැවෙහි වාන් ජලය එල්ලංගාවේ පහළ පිහිටි වැව් කරා ගලා යාමට හැකිවන පරිදි ඇළ මාර්ග පිළිසකර කිරීමට ද කටයුතු කර නොතිබුණි. | සුවදායී භූමි දර්ශ ව්‍යාපෘතියෙහි අරමුණු ඉටු වන පරිදි අදාළ කාර්යය ඉටු කර ඇත. |
| (iii). 2009 අංක 65 දරණ කැළෑ සංශෝධන පනතේ 7.1 (ඕ) අනුව යම් පාරක් තැනීම, දැනටමත් තනන ලද යම් පාරක් වෙනස් කිරීම, එසේ තනන ලද පාරක් භාවිතා කිරීම ආදී ක්‍රියා රක්ෂිත වනයක තහනම් ක්‍රියා ලෙස දක්වා තිබුණද සුවදායී භූමි දර්ශ ව්‍යාපෘතියේ පිරිවැය ඇස්තමේන්තුව අනුව රු.2,107,933 ක පිරිවැයක් දරා පිවිසුම් මාර්ගයක් සකස් කර තිබුණු අතර මෙම ව්‍යාපෘති ප්‍රදේශය තුම්බිකුලම රක්ෂිතයට අයත්වීම තුළ එය කැලෑ පනතට පටහැනි ක්‍රියාවක් බව නිරීක්ෂණය විය. | මෙම වැව ස්ථාපනය කිරීමේදී අදාල තාක්ෂණික නියෝජිත ආයතනය වන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත අදාළ අනුමැතීන් ලබාදී ඇත. එහිදී වැවක් ඉදිකිරීමට අනුමැතිය ලබාදී ඇති අතර, සොරොව්ව යනු වැවේ ප්‍රධාන අංගයකි. පසුගිය නියං සමයේ එල්ලංගාවේ පහළ ප්‍රදේශයේ වැව්වලට ජලය සපයා, නියඟයෙන් හානිවීමේ අවදානමක් තිබූ කුඹුරු අක්කර ගණනාවක් බේරා ගන්නා ලද්දේ මෙම සොරොව්ව ඔස්සේ ලබා ගත් ජලය වැව් බැම්ම කැඩී යාමට පෙර තිබූ ජල බස්නා මාර්ගය ඔස්සේ පහළ වැව් කරා ගෙනයාමෙනි. මෙම වැව් ප්‍රතිසංස්කරණය සිදු කිරීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2024.09.20 දින ලිඛිත අනුමැතිය ලබා දී ඇත. වර්තමානයේදී ව්‍යාපෘති සිදුකිරීමේදී අණ පනත් හා අනෙකුත් නීත්‍යානුකූල තත්ත්වයන් පිළිබඳ අවධානය යොමු කර ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. |
| (iv) තුම්බිකුලම වැව ප්‍රතිසංස්කරණයට අදාල ගිවිසුමේ නිමැවුම් ලෙස අක්කර 200 ක කුඹුරු ප්‍රතිස්ථාපනය සහ පරිසර පද්ධතිය ප්‍රතිස්ථාපනයද දක්වා තිබුණද 2013 අගෝස්තු 01 දිනැති හා අංක 1821/34 දරණ ගැසට් පත්‍රය මඟින් තුම්බිකුලම වැව සහ ඒ ආශ්‍රිත ප්‍රදේශ කිහිපයක් සහිත මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර් | උක්ත ප්‍රදේශයේ ක්ෂේත්‍ර පරීක්ෂාවක් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් හා වන සංරක්ෂක ජනරාල් ඇතුළු එම දෙපාර්තමේන්තු නිලධාරීන්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරීන්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් සිදු කර ඇත. ඒ අනුව මේ වන විට මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම |

| | |
|---|---|
| 2,744ක් පමණ තුම්බිකුලම රක්ෂිත වනාන්තරයට අයත් ලෙස නම්කර තිබුණු බැවින් එම වැව යටතේ කුඹුරු ප්‍රතිස්ථාපනය කළ නොහැකි බව නිරීක්ෂණය වූ අතර සුවදායී භූමි දර්ශ ව්‍යාපෘතිය යටතේ උක්ත ගිවිසුමේ නීත්‍යානුකූලව ළඟා කර ගත නොහැකි නිමවුම් දක්වා ඇති බව ද නිරීක්ෂණය විය. | පිළිබඳව සාකච්ඡාවන් පැවැත්වෙමින් පවතින බව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරීන්ගෙන් වාචිකව විමසූ විට දැනුම් දෙන ලදී. |
| **3.2 ප්‍රසම්පාදනයන්** | |
| (අ) ආසියා ශාන්තිකරයේ අමාත්‍යවරුන්ගේ හා පරිසර බලධාරීන්ගේ සංසදයේ 5 වැනි සැසිය සඳහා සහභාගී වූ නිලධාරීන් හට ආහාර සැපයීමට අදාල මිල කැඳවීම සඳහා ආයතන 03 විසින් ඉදිරිපත් කර තිබූ මිල ගණන් පරිසර අමාත්‍යාංශයේ ලංසු විවෘත කිරීමේ කමිටු සාමාජිකයන් විසින් විවෘත කළ බවට එම මිල ගණන් තුළ දින මුද්‍රා තබා අත්සන් කර නොතිබුණ අතර ඊට අදාල ලංසු විවෘත කිරීමේ කමිටු වාර්තාවක්ද නොමැති බව ලිපිගොනු පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. ඒ අනුව ලංසු විවෘත කිරීමේ ක්‍රමවේදයේ නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු නොවූ අතර අදාල තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.11.3 ප්‍රකාරව විධිමත් ආකෘතියකින් ඉදිරිපත් කර නොතිබුණි. | වර්තමානයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කරනු ලැබේ. |
| (ආ) 2023 සැප්තැම්බර් 27 වන දින ආසියා ශාන්තිකරයේ ආමාත්‍යවරුන්ගේ හා පරිසර බලධාරීන්ගේ සංසදයේ 5 වන සැසිය සඳහා සහභාගී වූ නිලධාරීන් හට ආහාර සැපයීමට අදාල ප්‍රසම්පාදනය සඳහා ප්‍රසම්පාදන කමිටු තිරණය ලබා දී තිබූ අතර එහිදී Lavinia Bakers වෙතින් සේවාව ලබා ගැනීමටත් එක් ආහාර වේලක් සඳහා ආහාර පැකට් 200 ලෙස මුලු ආහාර පැකට් 3,712 ක් ලබා දෙන ලෙස ඉල්ලුම් කර ඇතත් අවශ්‍යතාවය පදනම් කර ගනිමින් අවශ්‍ය ආහාර පැකට් ප්‍රමාණය ඇණවුම් කිරීමටත් එම ප්‍රමාණය ඉක්මවා යන්නේ නම් නැවත ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියට යටත්ව ලබා ගැනීමටත් අනුමැතිය ලබා දී තිබුණි. නමුත් මෙම සමුළුව සඳහා ආහාර පැකට් 8,423 ක් එනම් ඉහත මිල ගණන් කැඳවා තිබූ ආහාර පැකට් 3,712 ට අමතරව ආහාර පැකට් 4,711 ක් මිල දී ගෙන තිබුණි. මේ අනුව මිලදී ගැනීමට අනුමැතිය ලබා දුන් ප්‍රමාණයට වඩා සියයට 127 ක ආහාර පැකට් ප්‍රමාණයක් මිල දී ගෙන තිබුණු බව විගණනයේදී නිරීක්ෂණ විය. ඉහත කරුණු අනුව මෙම සමුළුව සඳහා අවශ්‍ය ආහාර සැපයීම වෙනුවෙන් රු.2,422,000 ක් වෙන්කර තිබුණද මේ සඳහා රු.4,443,970.00 ක් ගෙවා | මෙම සමුළුව පැවැත්වෙන අතරතුරදී රථවාහන රාජකාරී කළ නිලධාරීන් 105 ක්, විශේෂ කාර්ය බලකායේ අමතර නිලධාරීන් 30 ක්, සියළු ආරක්ෂක, රථ වාහන, බුද්ධි, කැරළි මර්ධන සහ නිල සුනඛ අංශ නිලධාරීන් ඇතුළුව සේවා මුර වලින් රාජකාරී සඳහා යොදවන ලද අතර එක් සේවා මුරයකට ආහාර පැකට් 235 බැගින් වැඩි කිරීමට සිදුවිය. ඇමති ආරක්ෂක අංශයට ද ඉල්ලීම පරිදි වරින්වර ආහාර පැකට් ප්‍රමාණ වැඩියෙන් සැපයීමට සිදුවිය. සැලසුම් කරන ලද ආකාරයට වඩා වැඩි ආහාර පැකට් ප්‍රමාණයක් සම්මන්ත්‍රණය පැවැත්වෙන අතරතුරදී ලබාදීමට සිදුවීම මත ආහාර සැපයීම වෙනුවෙන් වැය කිරීමට සිදු විය. මෙලෙස සිදුවූයේ ආරක්ෂක හේතූන් මත පූර්ව දැනුම්දීමක් නොකර අදාළ දිනයේ උදෑසන හෝ යම් රාජකාරියක් පැවරෙන ලද විගස ආරක්ෂක අංශයටද ආහාර අවශ්‍යතාවය ලබාදීම හේතුවෙනි. තවද රාජ්‍ය නායකයා හා විදේශ නියෝජිතයා මෙරටට පැමිණිමද එකම දිනක සිදු නොවීම ද මෙයට හේතු විය. වර්තමානයේදී වැඩසටහන් කටයුතු නිසි පරිදි හඳුනාගෙන සැලසුම් කර කටයුතු කරනු ලැබේ. |

| | |
|---|---|
| තිබූ අතර ආහාර සැපයීම සඳහා රු.2,021,970.00 ක් අපේක්ෂිත මුදල ඉක්මවා ගෙවා තිබූ බව විගණනයේදී තවදුරටත් නිරීක්ෂණය විය. | |
| (ඇ) ආසියා ශාන්තිකරයේ අමාත්‍ය වරුන්ගේ හා පරිසර බලධාරීන්ගේ සංසදයේ 5 වන සැසිය සඳහා සහභාගී වූ නිලධාරීන් හට ආහාර සැපයීම සඳහා තෝරාගත් Lavinia Bakers යන ආයතනය වෙත ඒ සඳහා ගෙවිය යුතු මුදල වූ රු.4,443,970.00 ක මුදල සඳහා වූ චෙක්පත Testa Bake House (Pvt) Ltd යන ආයතනයේ ටී.ඒ.ඩී. රංජිත් යන අයගේ පෞද්ගලික නමට ලබා දෙන ලෙස Lavinia Bakers ආයතනය විසින් ඉල්ලීමක් සිදු කර තිබූ අතර ඒ අනුව ආමාත්‍යාංශය විසින් ටී.ඒ.ඩී.රංජිත් යන පුද්ගල නාමයට චෙක්පත ලබා දී තිබුණි. ඉහත කරුණු අනුව ආහාර සැපයීමට සේවාව ලබා දුන් Lavinia Bakers ආයතනය නමින් චෙක්පත් ලබා නොදී රු.4,443,970.00 ක මුදලක් සඳහා ටී.ඒ.ඩී.රංජිත් යන පුද්ගල නාමයකට මුදල් ලබාදීමට අමාත්‍යාංශය කටයුතු කර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. | ආහාර සැපයීම සඳහා Lavinia Bakers ආයතනය තෝරා ගත් අතර එම ආයතනය ටී.ඒ.ඩී.රංජිත් යන නමට චෙක්පත ලබාදෙන ලෙස ඉන්වොයිස්පතෙහි සඳහන් කර තිබූ බැවින්, නමට චෙක්පත් ලබා දෙන ලදි. |
| **3.3 වත්කම් කළමනාකරණය** | |
| (අ). පරිසර අමාත්‍යාංශය සතු වාහන අතුරින් ධාවනය කළ නොහැකි තත්ත්වයේ පවතින වාහන 05 ක් අමාත්‍යාංශ පරිශ්‍රයේ සහ ගරාජ්වල් ගාල් කර ඇති අතර මෙම වාහන වර්ෂ 03 ත් 09 ත් අතර කාල පරාසයක් එලෙස ගාල් කර පැවතියදී අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. | ධාවනය කළ නොහැකි තත්ත්වයේ පැවති අපහරණය කළ යුතු බවට හඳුනාගත් අමාත්‍යාංශයට අයත් පහත අංක දරණ වාහන 2025.06.12 අපහරණය කර ඇත.<br>HK-8894 දරණ ඩබල් කැබ් රථය<br>KH-9235 දරණ ජීප් රථය<br>KK-9635 දරණ මෝටර් රථය<br>අංක 65-1578 දරණ ජීප් රථය සහ KB-7120 දරණ මෝටර් රථය අලුත්වැඩියා කර මේ වන විට රාජකාරි කටයුතු සඳහා යොදවා ඇත. |
| (ආ) 2022 ජනවාරි 25 දිනැති අංක 04/2022 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 (අ) ඡේදයට අනුව 2020 අගෝස්තු 31 දින වන විට කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට වාර්තා කරන ලද ධාවන තත්ත්වයේ නොපවතින අලුත්වැඩියා කිරීම ඵලදායී නොවන වාහන අපහරණය සිදුකර නොමැති නම් වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 05/2020 හි 02 (අ) මඟින් ලබා දී ඇති උපදෙස් පරිදි එවැනි වාහන අපහරණය කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට වහාම කටයුතු කළ යුතු වුවත් අමාත්‍යාංශය සතු වාහන 02 ක් 2020 දෙසැම්බර් 31 දින අපහරණය කිරීමට නිර්දේශ කර තිබුණද ඉහත චක්‍රලේඛ ප්‍රකාරව | අංක 65-1578 දරණ ජීප් රථය අමාත්‍යාංශයේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියක ප්‍රතිපාදන මගින් අලුත්වැඩියා කර ධාවනයට යොදවා ඇත.<br>KH-9235 දරණ මෝටර් රථය 2025.06.12 දින අපහරණය කිරීමට කටයුතු කර ඇත.<br>යුනයිටඩ් මෝටර්ස් ආයතනය වෙත අලුත්වැඩියාව සඳහා යොමු කර තිබූ අංක HQ-4331 දරණ ජීප් රථය අලුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් ඵලදායී නොවන බැවින් අපහරණය කිරීම සඳහා මේ වන විට තක්සේරු කමිටුවක් පත් කර ඇත. |

| | |
|---|---|
| කටයුතු කර නොතිබුණි. කොම්ප්ට්‍රොලර් ජනරාල්ගේ 2023 මාර්තු 09 දිනැති හා අංක CGO/ASM/Environment/General/21-1 දරණ ලිපිය මඟින් තවත් වාහනයක් අපහරණය කිරීමට අනුමැතිය ලබාදී තිබුණද අමාත්‍යාංශය විගණිත දින දක්වාම ඒ අනුව කටයුතු කර නොතිබුණි. | |
| (ඇ) පරිසර අමාත්‍යාංශයේ අමාත්‍ය කාර්ය මණ්ඩලය සඳහා අනුයුක්ත කර තිබූ වාහන නැවත භාරදෙන අවස්ථාවේදී සිදු කළ නිරීක්ෂණයන් පහත දැක්වේ<br>• මෝටර් රථයේ බඳ වටා තැලීම් සීරීම්<br>• ටේල් ලාම්පු, රිවර් ලාම්පු , බ්‍රේක් ලාම්පු කැඩී තිබීම<br>• ඉදිරිපස ව්‍යාජ අංක තහඩු සවි කිරීම<br>• මෝටර් රථයේ බඳ, වහලය හා වෙනත් ස්ථාන වල සීරීම් හා තැලීම් සහ ඩෑෂ්බෝඩය පුපුරා කැඩී යාම<br>• ඒසී කවුළුවල නොබ් අස්ථානගත වීම<br>• ඉදිරිපස ප්‍රධාන වීදුරුව (windscreen) පිපිරී තිබීම<br>• වම් පස හා දකුණු පස Tail Light කැඩී තිබීම<br>ඉහත අලාභයන් පිළිබඳ අදාල අවස්ථාවේදී අමාත්‍යාංශය දැනුවත් කර නොතිබුණු බැවින් එම අඩුපාඩු අලුත්වැඩියා කර රක්ෂණ ආවරණය මඟින් එම අලාභයන් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි වි තිබුණු බව නිරීක්ෂණය විය. | KS-7955 මෝටර් රථය - අමාත්‍ය කාර්ය මණ්ඩලය වෙත අනුයුක්ත කරන ලද මෙම මෝටර් රථය නැවත භාරදෙන අවස්ථාවේදී සිදුව තිබූ අලාභයන්ට අදාළව අලුත්වැඩියාව සඳහා වැයවූ මුදල එම මෝටර් රථය අනුයුක්ත කර තිබූ නිලධාරියා වෙතින් අයකර ගැනීමට කටයුතු කර ඇත.<br>KY-4966 මෝටර් රථය - අමාත්‍ය කාර්ය මණ්ඩලය වෙත අනුයුක්ත කර තිබූ මෙම මෝටර් රථය නැවත භාරදීමේදී එම රථයේ බඳ වටා සිදුව තිබූ තැලීම් හා සීරීම් අලුත්වැඩියාව අමාත්‍යාංශය මගින් සිදු කර නොමැති බැවින් ඒ සඳහා පිරිවැයක් දැරීමට සිදුවී නොමැත.<br>වාහන භාරදීමේදී එම වාහනවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේද මේ වන විට ක්‍රියාත්මක කර ඇත. |
| (ඈ) 2021 අප්‍රේල් 21 වන දින නිකුත් කර තිබූ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 38 වන අතිරේකය අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අංක 9.3.1 (අ) ප්‍රකාරව වාහන අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු සඳහා වන මිල කැඳවීම් ආර්ථික වශයෙන් ඵලදායී ද යන්න සලකා බලා අදාල වාහන වල දේශීය නියෝජිත ආයතන වෙතින් සිදු කර ගත හැකි බව දක්වා තිබුණි. 2023 වර්ෂයේදී වාහන සේවා කිරීම් වලට අදාලව වාහන ඒජන්තවරුන් හරහා වාහන සේවා කිරිම සඳහා වාහන 41 කට සේවා වාර 81ක් සඳහා රු.6,360,496.00 ක මුළු පිරිවැයක් දරා තිබුණ අතර මෙහිදී අදාල සේවා කිරීම් සඳහා දැරූ පිරිවැය ආර්ථික වශයෙන් ඵලදායී ද යන්න විගණනයේදී තහවුරු නොවීය. | වාහන වාර සේවා සිදුකිරීම සඳහා අදාළ වාහනය දේශීය නියෝජිත ආයතනය වෙත යොමු කිරීමේදී එම අවස්ථාවේදී හඳුනාගන්නා සුළු අලුත්වැඩියාවන්ද සිදුකර ඇති බැවින් එම පිරිවැය දරා ඇත. |
| (ඉ) ජාතික දේශගුණ විපර්යාස සඳහා වූ දත්ත හුවමාරු ජාලකරණ පද්ධතිය (National Climate Change Data Sharing Network) සඳහා දත්ත සපයනු ලබන පාර්ශවකාර ආයතන වෙත ලබා දීම සඳහා රු.12,446,500 ක් (VAT රහිත) වැයකර ඩෙස්ක්ටොප් | 2024.03.18 වන දින එම පරිගණක මෙම දත්ත එකතු කිරීම සඳහා පමණක් භාවිතා කරන ලෙසත්, නිසි පරිදි දත්ත, පද්ධතිය වෙත ඇතුලත් කරන ලෙසත් ආයතන වෙත දැනුවත් කරන ලදී. |

| | |
|---|---|
| පරිගණක යන්ත්‍ර 55 ක් 2020 දෙසැම්බර් 30 දින මිලදී ගෙන තිබුණ අතර මෙම පරිගණක යන්ත්‍ර පාර්ශවකාර ආයතන 55 ක් වෙත මිලදී ගත් දිනයේ සිට මාස 14 කට පසුව ලබා දී තිබුණි. විගණනයේදී නියැදි පරීක්ෂාවට භාජනය කරන ලද පාර්ශවකාර ආයතන 27 ක් අතුරින් පාර්ශවකාර ආයතන 20 ක් විසින්ම මෙම ඩෙස්ක්ටොප් පරිගණක යන්ත්‍ර ජාතික දේශගුණ විපර්යාස සඳහා වූ දත්ත හුවමාරු ජාලය වෙත දත්ත සම්ප්‍රේශනය කිරීමට හෝ ඊට අදාල දත්ත සැකසීම සඳහා භාවිතා කර නොතිබුණ අතර එක් පාර්ශවකාර ආයතනයක් පරිගණක යන්ත්‍රය භාවිතා නොකර ඇසුරුම් තුළම තබා ගෙන පැවැති අතර අදාල පරිගණකය එම ආයතනය සඳහා අවශ්‍ය නොවන බවද සඳහන් කරන ලදී. ඒ අනුව අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගැනීමෙන් තොරව පරිගණක යන්ත්‍ර බෙදාහැර තිබුණු බව නිරීක්ෂණය වූ අතර මෙම පරිගණක යන්ත්‍ර මිලදී ගැනීම මගින් ලඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු ලඟා කර ගෙන නොතිබුණු බවද නිරීක්ෂණය විය. | |
| (ඊ) ජාතික දේශගුණ විපර්යාස සඳහා වූ දත්ත හුවමාරු ජාලකරණ පද්ධතිය සඳහා රු.1,065,000 ක (VAT රහිත) පිරිවැයක් දරා ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 05 ක් 2020 නොවැම්බර් 10 දින මිලදී ගෙන තිබුණ අතර 2023 ඔක්තෝබර් 12 දින සිදු කරන ලද භෞතික විගණන පරීක්ෂාවේදී මෙම ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 05 අතුරින් යන්ත්‍ර 02 ක් අමාත්‍යාංශයේ මූල්‍ය අංශය වෙත ලබා දී ඇති බව නිරීක්ෂණය වූ අතර තවත් යන්ත්‍ර 03 ක් දේශගුණ විපර්යාස අංශයේ නිෂ්කාර්යව පවතින බවද නිරීක්ෂණය විය. | ලැප්ටොප් පරිගණක 03 ක් ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින බැවින්, එම ලැප්ටොප් පරිගණක අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| **3.4 අනාර්ථික ගනුදෙනු** | |
| 2013 වර්ෂයේදී අනතුරකට ලක්ව තිබූ වාහනයක් වර්ෂ 10 කට අධික කාලයක් අළුත්වැඩියා වියදම පියවීමට නොහැකිව පෞද්ගලික ගරාජයක රඳවා තිබුණු අතර 2023 වර්ෂයේදී මෙම වාහනය රු.1,800,000 කට අපහරණය කර තිබුණි. මෙම අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) යටතේ පරීක්ෂණය සිදු කර අළුත්වැඩියා වියදම අයකර ගත යුතු ආකාරය නිවැරදිව තීරණය කර නොතිබූ බැවින් අපහරණය මගින් ලද මුදලින් රු.1,614,105 ක් භාවිතා කරමින් අනතුරු අළුත්වැඩියා කිරීමේ වියදම පියවා ඉතිරි මුදල වූ රු.185,895 ක් පමණක් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේශනය කර තිබුණි. මේ අනුව රජයට | අංක KA-3327 දරණ ජීප් රථය අනතුරට ලක්වීම සම්බන්ධයෙන් රියදුරු වරදකරු ලෙස නිගමනය කළ නොහැකි බව මු.රෙ.104 (4) වාර්තාව මගින් තීරණය කර ඇති බැවින්, රථයේ අලාභය ඔහුගෙන් අය කර ගෙන නොමැත. |

| | |
|---|---|
| රු.1,614,105 ක අලාභයක් සිදු වී ඇති බව විගණනයේදී අනාවරණය විය. | |
| **3.5 කළමනාකරණ දුර්වලතා** | |
| (අ). මධ්‍යම පරිසර අධිකාරියේ 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනට අදාලව රු.14,531,330 ක මුදලක් පරිසර අමාත්‍යාංශය වෙත ගෙවිය යුතු බව දක්වා තිබුණි. ඒ අනුව මධ්‍යම පරිසර අධිකාරිය විසින් මීට වර්ෂ 10කට පමණ පෙර ක්‍රියාත්මක කර තිබූ ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා ලබාදී තිබූ ප්‍රතිපාදන වලින් නැවත රජයට ගෙවිය යුතුව පවතින රු.14,531,330 ක මුදලක් අයකර ගැනීම සම්බන්ධයෙන් පරිසර අමාත්‍යාංශය විසින් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | මධ්‍යම පරිසර අධිකාරිය විසින් ගෙවිය යුතු රු.14,531,330 ක මුදල 2024.08.06 දින රිසිට්පත් අංක R/24/550679 මගින් පරිසර අමාත්‍යාංශය වෙත ගෙවා ඇති අතර, එම මුදල 2024.08.07 දින රජයේ ආදායමට බැර කර ඇත. |
| (ආ). අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/1739/622/021 වූ “එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි නගරයේදී පැවැත්වෙන දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ පාර්ශවකරුවන්ගේ 28 වන සමුළුව” යන මැයෙන් පරිසර අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ 2023 සැප්තැම්බර් මස 07 දිනැති සංදේශය සඳහා මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ නිරීක්ෂණ තුළ “වියදම් පාලනය සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ විදේශ සංචාර සම්බන්ධයෙන් පනවා ඇති සීමාවන් හේතුවෙන් ඉහත සමුළුව සඳහා අත්‍යාවශ්‍යම හා අවම නිලධාරීන් සංඛ්‍යාවක් සහභාගී වීම සුදුසු වේ සහ එම නිලධාරී මණ්ඩලය නිශ්චිත ලෙස නම් කිරීමෙන් අනතුරුව ජනාධිපති ලේකම්ගේ පූර්ව එකඟතාවය සඳහා ඉදිරිපත් කළ යුතුය.” ලෙස දක්වා තිබුණි. එසේ අනුමැතිය ලබා ගෙන තිබූ නිලධාරීන්ට අමතරව අමාත්‍යාංශයේ තවත් නිලධාරීන් 06 දෙනෙකු මෙම සමුළුව සඳහා සහභාගී වී ඇති බව නිරීක්ෂණය වූ අතර එම නිලධාරීන් සමුළුවට සහභාගී වීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ පූර්ව එකඟතාවය ලබා ගෙන නොතිබුණ බවද නිරීක්ෂණය විය. තවද එම නිලධාරීන් 06 දෙනා අතුරින් නිලධාරීන් තිදෙනෙකු පරිසර සැලසුම් හා ආර්ථික අංශයට අනුයුක්තව කටයුතු කරන අතර එම නිලධාරීන් දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ සමුළුව සඳහා සහභාගී වීමට තෝරා ගැනීමේ ප්‍රමුඛතා පදනම විගණනයේදී තහවුරු නොවීය. තවද මුදල්, | අමාත්‍ය මණ්ඩල පත්‍රිකා මගින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට හා විදේශ සංචාර සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. |

| | |
|---|---|
| ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ නිරීක්ෂණ ලෙස "සමුළුව අවසන් වීමෙන් අනතුරුව, ශ්‍රී ලංකාව සඳහා දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් ආමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය." ලෙස දක්වා තිබුණද එවැනි වාර්තාවක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණ බව නිරීක්ෂණය විය. | |
| (ඇ) පරිසර අමාත්‍යවරයා හා කාර්ය මණ්ඩලය වෙත 2023 ඔක්තෝබර් 24 දින අමාත්‍යාංශය විසින් වාහන 07 ක් අනුයුක්ත කර තිබුණ නමුත් ඉහත වාහන වලට අමතරව විවිධ අවස්ථාවලදී අමාත්‍යාංශය සතු සංචිත වාහන 04 ක් ද ආමාත්‍ය කාර්ය මණ්ඩලය විසින් භාවිතයට ගෙන තිබුණි. 2023 ඔක්තෝම්බර් 04 දින සිට 2024 පෙබරවාරි 03 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුල මෙම සඳහන් වාහන 04 භාවිතා කර කිලෝමීටර් 16,950 ක් ධාවනය කර තිබුණ අතර මේ සඳහා ඉන්ධන (ඩීසල්) ලිටර් 2,366 අමාත්‍යාංශය විසින් ලබා දී තිබුණි. මේ අනුව චක්‍රලේඛ ප්‍රකාරව සහ අමාත්‍යවරයාට සහ අමාත්‍ය කාර්ය මණ්ඩලයට ලබාගත හැකිව තිබූ වාහන ප්‍රමාණය ඉක්මවා අනීතික ලෙස ලබාගත් වාහන 04 සඳහා ඉන්ධන ලීටර් 2,366 ක් ලබා දීමට අමාත්‍යාංශය රු.831,412 ක් වැය කර තිබූ බව විගණනයේදී අනාවරණය විය. | ජනාධිපති කාර්යාලය මගින් 2025 ජනවාරි මස 21 දිනැතිව නිකුත් කරන ලද අංක පීඑස්/සීඑස්ඒ/00/1/4/12 අනුව ගරු අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා හා එම කාර්ය මණ්ඩලය වෙත වාහන අනුයුක්ත කිරීම වර්තමානයේදී සිදු කරනු ලැබේ. |
| (ඈ) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 20/1399/301/006 හා 2020 සැප්තැම්බර් 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙහි ඇති සුදුසුකම් වලට පටහැනිව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් හිටපු පරිසර අමාත්‍යවරයාගේ උපදේශක ලෙස 2023 නොවැම්බර් 15 වන දින හිමිනමක් පත්කර තිබුණි. එසේම 2023 නොවැම්බර් 15 දින සිට 2024 පෙබරවාරි 03 දින දක්වා මෙම උපදේශක හිමිනමට උපදේශක දීමනා හා අනෙකුත් දිමනා ලෙස රු.484,331 ක් ගෙවා තිබුණ බව විගණනයේදී අනාවරණය විය. එම උපදේශක හිමිනමට අදාල උපදේශක තනතුර සඳහා පත්වීම් ලිපිය 2023 නොවැම්බර් 15 දින අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ලබා දී තිබුණ නමුත් අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි පෞද්ගලික ලේකම් විසින් එවා ඇති ලිපියකට අනුව පත්වීමේ දිනය 2023 ඔක්තෝබර් 24 දින සිට ක්‍රියාතමක වන බවත් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් නිකුත් කළ උපදේශක හිමිනම පත්කිරීමේ ලිපියෙහි දක්වා තිබුණි. මේ අනුව අමාත්‍යවරයාගේ උපදෙස් අනුව ඉහත | පරිසර අමාත්‍යවරයාගේ උපදේශක තනතුරට පත් කිරීම අමාත්‍යතුමාගේ දැනුම්දීම පරිදි ps/cm/gpa/41/2020 අංක දරණ අමාත්‍ය මණ්ඩල සංදේශයේ උපදේශයන්ට යටත්ව හිමිනමගේ වෘත්තීය හා අධ්‍යාපන සුදුසුකම් පරිදි සිදු කර ඇත. හිමිනම ජාතික ඉගැන්වීම් ඩිප්ලෝමා, අධ්‍යාපන ඩිප්ලෝමා හා කලා උපාධියක් සහිතව පශ්චාත් උපාධියක් ලබා ඇත. රජයේ පාසලක ගුරු සේවයේ 1 ශ්‍රේණියේ සහ කලාප අධ්‍යාපන කාර්යාලයක සහකාර අධ්‍යක්ෂ ලෙස රජයේ විධායක ශ්‍රේණියේ වසර 10 කට ආසන්න කාලයක් සේවය කර ඇත. එසේම ජනමාධ්‍ය අමාත්‍යාංශයේ උපදේශක මණ්ඩල සම්බන්ධීකාරක, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ගුවන් විදුලි සංස්ථාව, ස්වාධීන රූපවාහිනි යන රජයට අනුබද්ධ ආයතනයන්හි උපදේශක මණ්ඩල සාමාජික ලෙස ද, මධ්‍යම පළාත් සභාවේ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ උපදේශක මණ්ඩල සාමාජික ලෙස ද තනතුරු දරා ඇත. තවද මධ්‍යම පළාතේ නැනෝදා වෘත්තීය අධ්‍යාපන ආයතනයේ ආචාරධර්ම භාර ගුරුවරයා ලෙස කටයුතු කර ඇත. එබැවින් අදාළ හිමිනමගේ රාජ්‍ය සේවයේ පළපුරුද්ද රජයේ ආයතනවල දෙපාර්තමේන්තු උපදේශක තනතුරුවල පළපුරුද්ද සලකා බලා උක්ත |

| | |
|---|---|
| පරිදි කටයුතු කිරීම නිසා 2023 ඔක්තෝබර් 24 දින සිට 2023 නොවැම්බර් 15 දක්වා විධිමත් පත්වීම් ලිපියක් නොමැති දින 23 ක කාලයක් සඳහා රු.74,194.00 ක් උපදේශක දීමනා සහ අනෙකුත් දීමනා ලෙස රු.4,452ක් වූ මුළු එකතුව රු.78,646 ක් අමාත්‍යාංශ අරමුදල් මඟින් ගෙවා තිබූ බව විගණනයේදී තවදුරටත් නිරීක්ෂණය විය. | අමාත්‍යාංශ සංදේශයේ 2.4 අනුව හා එම සංදේශයේ 2.3 සඳහන් අවස්ථා දෙකෙන් වඩාත් සුදුසු ආකාරය බලා එම පත්වීම සිදු කරන ලදී. අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි හිමිනම 2023.10.24 දින සිට උපදේශක තනතුරේ රාජකාරි කර ඇති අතර මේ බව දැනුම් දීම ප්‍රමාද වී ඇත. ඒ අනුව, පත්වීම් ලිපිය නිකුත් කර ඇත්තේ 2023.11.15 දාතමයෙනි.<br>මේ අනුව අමාත්‍ය මණ්ඩල පත්‍රිකා මගින් ලබා දී ඇති නිර්දේශ ප්‍රකාරව කටයුතු කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |
| **4. මානව සම්පත් කළමනාකරණය** | |
| (අ) 2023 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වල පුරප්පාඩු 21 ක් පවතින බව නිරීක්ෂණය විය. | විධායක මට්ටමට අයත් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, විද්‍යාත්මක සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය බැවින්, එකී පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය MISCO දත්ත පද්ධතිය හරහා හා ලිඛිතව වරින් වර දැනුවත් කිරීම් සිදු කර ඇත. |
| (ආ) 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන නීති නිලධාරි තනතුර මෙන්ම නීති නිලධාරි තනතුරු 02 ක් වශයෙන් නීති අංශයට අනුමත මුළු තනතුරු සංඛ්‍යාවම පුරප්පාඩු ව පැවතුණි. | නීති නිලධාරියෙකු විවෘත බඳවා ගැනීම් යටතේ සම්මුඛ පරීක්ෂණ පවත්වා බඳවා ගැනීමට මේ වනවිට කටයුතු කරමින් පවතී. ප්‍රධාන නීති නිලධාරී තනතුරට අමාත්‍යාංශයේ එකඟතාවය ඇතිව වෙනත් රාජ්‍ය ආයතනයක නිලධාරියෙකුගේ සේවය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ඇ) පරිසර අමාතාංශය සඳහා අවශ්‍යතාවයක් නොමැති ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ I, II හා III ශ්‍රේණි සඳහා අනුමත තනතුරු 05 ක් අමාත්‍යාංශ කාර්ය මණ්ඩල තනතුරු ලෙස අනුමත කරවාගෙන තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට එම තනතුරු 05 ම පුරප්පාඩුව පැවතුණි. එම තනතුරු සඳහා ලබා දී ඇති අනුමැතිය සංශෝධනය කරවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පරිසර අංශය හා වනජීවී අංශය ඒකාබද්ධ කර අමාත්‍යාංශයේ අවශ්‍යතා පරිදි යෝජනා කරමින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අංක - ENV/ADM/02/02/65 හා 2026.03.13 දිනැතිව යෝජනාවක් ඉදිරිපත් කර ඇත. |
| (ඈ) 2023 ජනවාරි 25 දින අමාත්‍යාංශයට සංවර්ධන නිලධාරි තනතුරු 299 ක් සඳහා අනුමැතිය ලබා දී තිබුණ ද එම අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා සංවර්ධන නිලරින් 267 ක් අමාත්‍යාංශයට අනුයුක්ත කර ඇතත් 2023 දෙසැම්බර් 31 දිනට ඒ සඳහා කාර්ය මණ්ඩල තනතුරු අනුමත කරගෙන නොතිබුණි. | එවකට පැවති රජය මඟින් ගත් ප්‍රතිපත්තිමය තීරණයක් යටතේ මෙම අමාත්‍යාංශයට සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කරන ලදී.<br>කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/CM/24/14 හා 2025.01.15 දිනැති ලිපියෙන් සංවර්ධන නිලධාරීන් 568 ක් සඳහා මෙම අමාත්‍යාංශයට අනුමැතිය ලබා දී ඇත. මේ අනුව මේ වන විට අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන නොමැත. |

වෛද්‍ය දම්මික පටබැඳි,
පරිසර අමාත්‍ය